# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1764/11 – 2012 ජූනි 27 වැනි බදාදා – 2012.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2012 අංක 148 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2002/ඊ/47.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 100/05/03/01/26.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 ජූනි මස 14 වැනි දින,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කෑගල්ල.

2. **ඉඩමේ විස්තරය.**– කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙයාල දහමුන පත්තුව සුළු කොට්ඨාසයේ, පල්ලේ කරඬුපොත ගමේ පිහිටි කෑගල්ල දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් 2006.02.15 දිනැතිව පිළියෙල කරන ලද අංක කෑ3191 දරන මූලික පිඹුරේ කැබලි අංක 8 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.9131ක් පමණ වූ සේරුගස්තැන්න වත්ත නමැති පහත සඳහන් මායිම් තුල පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අංක 8 – සේරුගස්තැන්න වත්ත – ප්‍රමාණය: හෙක්. 0.9131**

උතුරට: 3 වැනි ඉඩම් කැබැල්ල; නැගෙනහිරට: ඒ 873 වැනි මූලික පිඹුරේ 1 වැනි ඉඩම් කැබැල්ල සහ කෑ 1292 වැනි මූලික පිඹුරේ 2 වැනි ඉඩම් කැබැල්ල; දකුණට: මාර්ගය (මහා මාර්ග) කෑ 231 වැනි මූලික පිඹුරේ 1 වැනි ඉඩම් කැබැල්ල, කෑ 1292 වැනි මූලික පිඹුරේ 1 වැනි ඉඩම් කැබැල්ල සහ කෑ 231 වැනි මූලික පිඹුරේ 2 වැනි ඉඩම් කැබැල්ල; බටහිරට: කෑ 1292 වැනි මූලික පිඹුරේ 1 වැනි ඉඩම් කැබැල්ල 7, 5 සහ 3 වැනි ඉඩම් කැබැලි.

07 - 328

1A – G 16243 – 380 (2012/06)

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 72/2 හා 1980.01.21 වැනි දින දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද්දා වූ ද, 1980 අංක 40 හා 1980.01.07 දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මු.පි.ගා. 1647හි කැබලි අංක 1 හි පමණක් භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 72/2 හා 1980.01.21 දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 1980 අංක 40 හා 1980.01.07 දින දරන ආඥාවේ කැබලි අංක 1 පමණක් මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 03/ජේ/77/එල්/255.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බගම/ප්‍රාලේ/510.
2012 ජුනි මස 14 වැනි දින,
ඉඩම් සහ ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තෙලිකඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක ගා 1647 සහ 1981.01.28 දිනැති මූලික පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් රූඩ් 01, පර්. 10.5ක් පමණ වන පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලි එක (01) ට මායිම්:

උතුරට: එච්. එම්. චාර්ලිස් සහ තවත් අය හිමිකම් කියන පල්ලියගෙවත්ත නොහොත් උපාසකවත්ත; නැගෙනහිරට: ජී. එච්. ඩැනී හිමිකම් කියන ඕපාතගෙවත්ත සහ මෙම පිඹුරේ කැබලි අංක 4; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 4, කැබලි අංක 2 සහ ඩී. ඒ. විජේසුන්දර සහ තවත් අය හිමිකම් කියන අඹගහවත්ත නොහොත් ගමගෙවත්ත (හි. පි. 164083); බටහිරට: ඩී. ඒ. විජේසුන්දර සහ තවත් අය හිමිකම් කියන අඹගහවත්ත නොහොත් ගමගෙවත්ත (හි. පි. 164083) සහ ප්‍රධාන මාර්ගය (වක්වැල්ල සිට දොඩන්ගොඩ).

07 - 329

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.